# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**07 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 02 යි

නම: ........................................................................................ වි. අංකය: ...........

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංකය 1 සිට 10 දක්වා ප්‍රශ්න වල අදාළ පිළිතුරට යටින් ඉරක් අඳින්න

1) සමාජයක කුඩාම හා වැදගත් ම ඒකකය.
   1) පාසල 2) පන්සල
   3) පවුල 4) සංවිධානය

2) මව, පියා හා දරුවන් පමණක් සමන්විත පවුල්
   1) න්‍යෂ්ටික පවුල 2) විස්තෘත පවුල
   3) ස්ථාවර පවුල 4) ඥාති පවුල

3) සමාජයට ගැළපෙන සමාජයට අවශ්‍ය පුද්ගලයකු ලෙස ජන සමාජයට පිවිසීම සඳහා
   1) අරමුණු සිත තුළ තබා ගත යුතුය.
   2) ඔබ ජීවත්වන සමාජයේ අපේක්ෂාවන් මෙන්ම ඔබේ අරමුණු ද ගලපා ගැනීමට හැකි විය යුතුය.
   3) ඔබ ජීවත්වන සමාජයේ අපේක්ෂාවන් කෙරෙහි පමණක් අවධානය යොමු කළ යුතුය.
   4) එදිනෙදා ජීවිතයේදී විවිධ ආකර්ෂණීය අරමුණු පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

4) වැරදි මඟට යොමු වූ මිතුරන් සුමගට යොමු කිරීමට උත්සාහ කිරීම.
   1) අපගෙන් සමාජයට ඉටුවිය යුතු වගකීමකි.
   2) අපගෙන් සමාජයට ඉටුවිය යුතු යුතුකමකි.
   3) අපගෙන් සමාජයට ඉටුවිය යුතු වගකීමක් මෙන්ම යුතුකමක් ද නොවේ.
   4) අපගෙන් සමාජයට ඉටුවිය යුතු වගකීමක් මෙන්ම යුතුකමක් ද වේ.

5) ක්‍රීඩාවල නිරතවීමෙන් පුද්ගලයා තුළ වර්ධනය වන ගුණාංගයක් නොවන්නේ,
   1) නීතිගරුක වීම. 2) වින්දනය හා සතුට
   3) දුක හා ශෝකය 4) ජය හා පරාජය සතුටින් විඳ දරාගැනීම.

6) පුද්ගලයින් මුහුණපාන විවිධ අවස්ථාවන්ට සම්බන්ධ සිතතුළ ජනිතවන සිතුවිලි හා හැඟීම්
   1) චිත්තවේග ලෙස හඳුන්වයි. 2) අවංකත්වය ලෙස හඳුන්වයි.
   3) අපේක්ෂා ලෙස හඳුන්වයි 4) අභියෝග ලෙස හඳුන්විය.

7) පවුලේ සාමාජිකයකු ලෙස ඔබගේ යුතුකමක් හා වගකීමක් වන්නේ
   1) ආහාර හා පෝෂණ ලැබීම 2) පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම
   3) අධ්‍යාපනය ලැබීම 4) රැකවරණය ලැබීම

8) ජන සමාජයේ පවතින අයිතිවාසිකම් අතර සිවිල් අයිතිවාසිකම් ගණයට අයත් වන්නේ,
   1) ආණ්ඩුව විවේචනය කිරීම 2) රජයේ තනතුරු දැරීම
   3) කැමති තැනක ජීවත්වීම 4) දේශපාලන පක්ෂයකට බැඳීම.

9) අන්තර් සබඳතාවල පදනම ආරම්භ වන්නේ,
   1) පාසල තුළිනි 2) සාමාජය තුළිනි
   3) ආගමික මධ්‍යස්ථාන තුළිනි 4) පවුල තුළිනි

10) පහත සඳහන් කරුණු අතරින් සදාචාරාත්මක යුතුකමක් ඇතුළත් කරුණ තෝරන්න.
   1) රජයට අවනතවීම 2) වැඩිහිටියන්ට සැලකීම
   3) රාජකාරි නිසිලෙස ඉටුකිරීම 4) බදු ගෙවීම

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

**(යුතුකම්, අභියෝග, දත්ත, සාර්ථකත්වයට, අයිතිවාසිකම්)**

11) ජීවන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වීමේදී විවිධ බාධක හා සීමාවලට මුහුණ දීම .................................................. ලෙස හඳුන්වයි.

12) කිසියම් විෂය ක්ෂේත්‍රයක් හා සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර .................................................. නමින් හඳුන්වයි.

13) පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවැරෙන කාර්යයන් ඉටුකිරීමට ඇති බැඳීම .................................................. ලෙස හඳුන්වයි.

14) ජන සමාජය මගින් පුද්ගලයාට නැත්නම් තමන්ට ලබා දී ඇති වරප්‍රසාදයන් .................................................. වේ.

15) හැකියාවන් හා දක්ෂතාවයන් වර්ධනයට උපකාර වන වැඩ සටහන් භාවිතයට පුරුදු වීම ජීවිතය .................................................. බෙහෙවින් උපකාරී වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා වගන්ති හරි (✓) නම් හරි ලකුණ ද වැරදි (✗) නම් වැරදි ලකුණ ද යොදන්න.**

16) විවේකය අර්ථවතව ගත කිරීමට සඳහා හොඳ පොත පත කියවීමට පුරුදු පුහුණු විය යුතුය. (      )

17) අනාගතයේ දී සමාජය තුළ හිමිවන ස්ථානය තීරණය කරන ප්‍රධාන සාධකය අධ්‍යාපනයයි. (      )

18) ඕනෑම ගැටලුවකදී හෝ ප්‍රශ්නයක දී ඒ සඳහා ඇත්තේ එකම විසඳුමක් පමණි (      )

19) මිනිසා උතුම් සම්පතක් වීමට නම් එම සම්පත මානව ගුණාංගවලින් පිරිපුන් විය යුතුය. (      )

20) පාරිභෝගියකු වශයෙන් වෙළඳ පොළ තත්ත්වය පිළිබඳ සැලකිලිමත් වීම එතරම් වැදගත් නොවේ. (      )

# පුරවැසි අධ්‍යාපනය - II

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි

---

1) i. ඔබේ පාසලේ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. එම මූලාශ්‍ර තුළින් හෙළිකරගත හැකි තොරතුරු දෙක්ක ලියන්න. (ලකුණු 2)

iii. ඔබේ අධ්‍යාපනික අවශ්‍යතා සඳහා එම තොරෙතුරු යොදාගත් අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 4)

iv. ඔබේ හැකියාවන් අදහස් නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා පාසල සපයා ඇති පහසුකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

v. තොරතුරු ඉක්මණින් හා පහසුවෙන් ලබා ගැනීම සඳහා පාසල දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2)

vi. පාසලේ සංවර්ධනය සඳහා තොරතුරු පවත්වා ගැනීම තුලින් අත්කර ගත හැකි වාසි දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

2) i. බුද්ධිමත් පාරිභෝගිකයකු ලෙස කටයුතු කිරීමේදි සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ඇසුරුම් සහිත නිෂ්පාදනවල මුද්‍රණය කර ඇති විස්තර හතරක් ලියන්න. (ලකුණු 4)

iii. දෙමාපියන් විදේශ රැකියා සඳහා මවුබිමින් බැහැරව යාමේදී මුහුණ දීමට සිදුවන අභියෝග එකක් සඳහන් කර එය ජය ගැනීම සඳහා ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 5)

3) i. යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. යහපත් පුරවැසියකු සතුවිය යුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 4)

iii. පවුල් ඒකකය තුළ ඥාති සම්බන්ධතා පවත්වාගෙන යාම නිසා පවුලේ සාමාජිකයන්ට ලැබෙන ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

4) i. ජන සාමජයේ පවතින අයිතිවාසිකම්වල ලක්‍ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ළමයින් හා සම්බන්ධ සමාජ වගකීම් දෙකක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5)

5) i. අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. වර්තමාන සමාජයේ බොහෝ සාමාජිකයින් මුහුණ දෙන අභියෝග අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු 4)

iii. අභියෝග සාර්ථකව ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

6) i. විස්තෘත පවුලක සාමාජිකයෙක් ලෙස ජීවත්වීම නිසා භුක්ති විඳීමට ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. පවුලක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. පවුලක් තුළ සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් රැක ගැනීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 5)

7) i. ආගමික ස්ථානවල ක්‍රියාත්මක වන වැඩ සටහන්වල මූලික අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම නිසා අත්කරගත හැකි ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 4)

iii. අයහපත් චිත්තවේගී තත්ත්වයන් පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ලකුණු 5)